C
374
RAJ

# ද්විතීයික පාසලේ ඉතිහාසය හදාරන ශිෂ්‍ය සංඛ්‍යා කැපී පෙනෙන ලෙස පහත වැටීමට හේතු හා ඒවාට පිළියම් යෝජනා කරන අධ්‍යයනයක්.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධයකි.

නිබන්ධක :

අයි. කේ. රාජපක්ෂ

ශාස්ත්‍රවේදී (ලංකා) 1975

අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන) 1984

උපදේශක:

අධ්‍යාපනවිද්‍යා අංශාධිපති

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ආර්. පී. ලියනගේ මහතා

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

1 9 9 1

438218

## හැඳින්වීම (සාරසංග්‍රහය)

සමාජ සභ්‍යත්වයේ විකාශනය ඉතා පැහැදිලි වන මග ඉතිහාසය බව අනාවරණය වී තිබෙන මෙවන් අවධියක අධ්‍යාපනය තුළින් ජාතික අපේක්ෂාවන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන කවර රටක් වුවද මූලික අවධානය යොමුකළ යුත්තේ අතීතයේ සිදුවූ දේ තේරුම් ගෙන ඒ අනුව වර්තමානය ගොඩනගා ගැනීමටය. එබැවින් රටක පැවතිය යුතු සමාජ හරයන් ගුණධම් පද්ධතීන් හා සාමකාමී ස්වභාවය නැවත ගොඩනගා ගැනීමේදී ඉතිහාසය වැනි විෂයක අවශ්‍යතාවය අද වඩා වඩාත් වැදගත් වෙමින් පවතී.

වර්තමානයේ එවන් උනන්දුවක් ඇතිවී ඇතත් ගතවූ දශක දෙකක පමණ කාලය තුළ ද්විතීය පාසල් ක්ෂේත්‍රයේ මෙන්ම විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේද ඉතිහාස විෂය හදාරන ශිෂ්‍ය සංඛ්‍යා සීඝ්‍රයෙන් පහත වැටුනු බැවින් එවන් තත්වයක් ඇතිවීමට හේතු කවරේදැයි විමර්ශනය කර ඒවාට පිළියම් යෝජනා කිරීමෙන් ඉතිහාස විෂය වර්ධනයට යෝග්‍ය අනාගත වැඩ පිළිවෙල සකස් විය යුතු ආකාරය යෝජනා කිරීමත් ඵලදායී මෙන්ම කාලෝචිත යයි මට හැඟීයෙන්,

" ද්විතීයික පාසලේ ඉතිහාසය හදාරන ශිෂ්‍ය සංඛ්‍යා තැපී පෙනෙන ලෙස පහත වැටීමට හේතු හා ඒවාට පිළියම් යෝජනා කරන අධ්‍යයනයක්'

A STUDY TO INVESTIGATE THE CAUSES AND PROPOSE REMEDIAL SOLUTIONS FOR THE SHARP DROP OF THE STUDENT NUMBERS OFFERING HISTORY AS A SUBJECT IN THE SECONDARY SCHOOL"

යන මාතෘකාව මගේ ශාස්ත්‍රපති නිබන්ධනය සඳහා යෝජනා කළෙමි. මෙහි ද්විතීය පාසල යන්නෙන් අදහස් කලේ ප්‍රාථමික අවධියෙන් පසු කෙනෙකු ප්‍රවිෂ්ට වන 6 වසර සිට 13 වසර දක්වා වූ අට වසරක අධ්‍යාපනය ලබන ආයතනයයි. මෙයින් හයවැනි වසර සිට නව වැනි වසර දක්වාවූ මුල් සිවු වසර කනිෂ්ඨ ද්විතීයික පාසල වශයෙනුත් දහවැනි වසර සිට 13 වැනි වසර දක්වාවූ සතර අවුරුද්ද ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල වශයෙනුත් සලකා එම අවධීන් දෙකේම ඉතිහාස විෂය හැදෑරීම හා බැඳුණු තොරතුරු මෙහිදී සැලකිල්ලට ගැණුනි.

ඉතිහාසය යනු අපේ අතීත සිදුවීම් පෙළගැස්වීමකි. අතීතයේ සිදුවූ දේ පිළිබඳ තේරුම් ගැනීමද ඉතිහාසය යනුවෙන් හැඳින්විය හැකිය.

ලංකාවේ විෂය මාලාව නිශ්චිත ස්වරූපයක් (1900 දී) ගැනීමෙන් පසු 1907 දී පමණ ද්විතීයික පාසලේ ලංකා ඉතිහාස විෂය ඉගැන්වීම ආරම්භ විය. 1914 ව්‍යවස්ථා සංග්‍රහයෙන් පවා සිදුවූයේ අටවැනි පංතිය (8) දක්වා ඉතිහාසය ඉගැන්වීමය. මෙම තත්වය 1928 වනතෙක් පැවති අතර 1938 දී නැවත පශ්චාත් ප්‍රාථමික ශ්‍රේණිවල විෂය මාලාවේ වෙනසක් සිදුවිය. 6,7,8 වැනි පශ්චාත් ප්‍රාථමික පංතිවල විෂය මාලාවට වෛකල්පිත විෂයක් ලෙස ඉතිහාස විෂය ඇතුලත් විය. 1940 දී ඇතිකළ සංශෝධිත අධ්‍යයන පරිපාටියේදී එතෙක් වෛකල්පිත ස්වභාවයෙන් පැවති ඉතිහාස විෂය අනිවාර්ය විෂයයක් බවට පත්විය.

1943 අධ්‍යාපන විශේෂ කාරක සභාවේ නිදහස් අධ්‍යාපන යෝජනාව අනුව 1945 ඔක්තෝබර් 1 දා සිට අනුක්‍රමයෙන් අධ්‍යාපනය ලබන මාධ්‍ය මවුබස බවට පත් වීමත් සමග සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම නිසා ඉතිහාසය හදාරන ශිෂ්‍ය පිරිස සීඝ්‍රයෙන් වැඩිවිය. මේ තත්වය 1956 පමණ වනතෙක් පැවති අතර ඉන්පසු කාලයේදී විද්‍යා අධ්‍යාපනයද මවු බසින් දීම නිසා විද්‍යා අංශයට සිසුන් වැඩියෙන් නැඹුරු විය. මේ නිසා 1960 දශකයේ අවසාන කාලයේදී පමණ ඉතිහාසය හදාරන ශිෂ්‍ය පිරිස තරමක අඩුවීමක් දක්නට ලැබුනි.

1970 දශකය වනවිට අනුක්‍රමයෙන් වර්ධනයවූ විරැකියා ප්‍රශ්නය ඉදිරියේ ඉතිහාස විෂයට තවත් දුර්භාග්‍ය සමයක් උදාවිය. එනම් ලබන ලද උපාධියෙන් රැකියාවක් ලබාගැනීමේදී ඉතිහාස හැදෑරූ අයට රැකියා අවස්ථා ලබා ගැනීම දුෂ්කර වූයෙන් වඩ වඩාත් රැකියා ලබාගැනීමට පහසු විෂයන් තෝරා ගැනීමට සිසුන් පෙළඹීමත් සමග ඉතිහාස විෂයෙන් සිසුන් අනුක්‍රමයෙන් ඈත් වන්නට පටන් ගැණුනි. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලදී විශේෂයෙන් කණිෂ්ඨ ද්විතීයික පාසලේ විෂය මාලා ප්‍රතිසංස්කරණ කරද්දී සමාජ අධ්‍යයනය යනුවෙන් සමෝධානික විෂයක් ඉදිරිපත් කිරීමත් සමග කණිෂ්ඨ ද්විතීයික පාසලේ ඉතිහාසය සම්පූර්ණයෙන්ම අහෝසි විය.

එතැන් සිට ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසලේ විෂය තෝරා ගැනීමේදී වුවද සිසුන් ඉතිහාස විෂය අඩුවෙන් තෝරා ගැනීමට වූයේ හුදෙක් විශ්වවිද්‍යාලයට ගොස් උපාධියක් ලබාගත් විටද එය ආර්ථික විද්‍යාව ,භූගෝල විද්‍යාව වැනි සමාජ විද්‍යා විෂයයන්ට තරම් රැකියා ලබාගැනීමට උපකාරී නොවූ හෙයිනි.

රැකියා දීමේදී රැකියා ප්‍රධාන ආයතන මගින් (පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය) වාණිජමය වැදගත්කමක් තිබූ විෂයන්ට ඉල්ලුම් කිරීම නිසා ඉතිහාසය වැනි විෂයන් සමාජය අපේක්ෂා කරන විෂයයන් නොවීය.

මෙවැනි විවිධ හේතූන් මත 1970 දශකයේ සිට මේ දක්වාද ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසලේ සිසුන් ඉතිහාසයෙන් බැහැරවූ ආකාරයක් දක්නට ඇත.

ඒ පිළිබඳ විමසීමක් කිරීම හා එයට හේතු විමර්ශනය කිරීමත් ඒවාට පිළියම් යෝජනා කිරීමත් මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනයේදී මා වැඩි වශයෙන් අනුගමනය කළේ ' ඓතිහාසික හා විස්තරාත්මක '

"(Historical and Descriptive Research) පර්යේෂණ ක්‍රමයයි.

මෙම නිබන්ධනය අවසානයේ මූලාශ්‍ර හා උපග්‍රන්ථ යටතේ සඳහන් කර ඇති දෙස් විදෙස්හි කලින් කලට පළවූ පොතපත , චක්‍රලේඛ, වාර්තා, ප්‍රශ්නාවලි හා පළ නො කළ පර්යේෂණ කෘතීන් සමහරක්ද පරිශීලනය කරමින් සකස් කර ඇති මෙම ශාස්ත්‍රපති නිබන්ධනය පරිච්ඡේද 6 ක පිටු 226 කින් හා මූලාශ්‍ර හා උපග්‍රන්ථ පිටු 54 කින්ද සමන්විතය.

උක්ත මාතෘකාව යටතේ අවශ්‍ය තොරතුරු හා දත්ත එක්රැස් කිරීමේදී බොහෝ විට මතුවූ පහත දැක්වෙන දුෂ්කරතා සමහරක් නිසා ඇතැම් අවස්ථාවල ලබාගතහැකි වූ සීමාවන් තුළ අධ්‍යයනය කිරීමට සිදුවිය.

1. ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසලේ අවසාන දෙවසර (උ.පෙළ) හැර අනෙක් වසර 6 ක විෂය මාලාව තුළ දශක දෙකකට ආසන්න කාලයක් (1970-1990) ඉතිහාසය ලෙස වෙන්වූ විෂයක් නොවීම නිසා ඊට අදාල පාඨමාර්ග චක්‍රලේඛ වාර්තා හා පොත්පත් හා වෙනත් තොරතුරු සපයා ගැනීම දුෂ්කරවීම.
2. ගුරු වරුන් හා ගුරු උපදේශක වරුන්ගේ තොරතුරු ලබාගැනීමේදී මතුවූ ගැටළු.
3. ශ්‍රී ලංකාවේ අ.පො.ස. විභාග වල පවතින අතිශය රහස්‍යභාවය නිසා එම විභාග අපේක්ෂකයින්ගේ පිළිතුරු පත්‍ර ලබාගැනීමට අවස්ථාවක් නොලැබී යෑම.

4. විශ්වවිද්‍යාල වලින් ද අපේක්ෂිත ප්‍රතිචාරයක් අපේක්ෂා කළතරමට නොලැබීම.

5. ප්‍රතිපත්තිමය වශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග වල අස්ථාවරත්වය.

6. ලංකාවේ විවිධ ප්‍රදේශවල පවත්වනු ලැබූ ඉතිහාසය විෂය හා සම්බන්ධ පුහුණු සැසි වලට සහභාගිවීමට අවස්ථාවන් ලබාගැනීමට තිබූ අපහසු තාවය.

මෙවැනි දුෂ්කරතා වලින් සීමාවූ ක්ෂෙත්‍රය තුළ කරන ලද මෙම අධ්‍යයනයේ පළමුවන පරිච්ඡේදයෙන් ප්‍රස්තුතයට පිවිසීමට අර්ථවත් ස්ථාවරයක් සකස් කරගැනීම සඳහා

' පාසල් විෂයයක් වශයෙන් අධ්‍යාපනයේදී ඉතිහාසය වැදගත්වීම'

සැකෙවින් දැක්වීමට උත්සාහ කළෙමි. ඒ සඳහා විවිධ විද්වතුන් හා ඉතිහාසඥ යින් කලින් කලට ඉදිරිපත් කළ අර්ථසිචන හා ඉතිහාස විෂය දෙස බලන ලද දෘෂ්ටි කෝණයන්ද ඔස්සේ ගොඩනැගුණු සංකල්පයන්ද උපයෝගී කර ගතිමි. එම කොටස අවසානයේ ඉතිහාස විෂය අධ්‍යයන කාර්යයට වැදගත්වන ආකාරය ගම්‍යවන අර්ථ පැහැදිලි කිරීම සඳහා වෙන්කර ගතිමි.

ඉක්බිතිව විවිධ රටවල ඉතිහාස විෂයට හිමිවන තැන පිළිබඳ පැහැදිලි කරමින් ඉතිහාස විෂයයෙහි පවතින අධ්‍යාපනික වැදගත්කමද සාකච්ඡා කළෙමි.

මෙම හා ඊයයේදී ලෝකයේ විවිධ රටවල් වර්ග එනම් සංවර්ධිත (එංගලන්තය) සමාජවාදී (සෝවියට් රුසියාව) හා සංවර්ධනය වෙමින් පවතින (ඉන්දියාව) වශයෙන් එක වර්ගයෙන් එක් රට බැගින් රටවල් තුනක් තෝරාගෙන එම රටවල ඉතිහාස විෂයේ ස්වභාවයද විමසුමට ලක් කළෙමි.

දෙවන පරිච්ඡේදයෙන් ලංකාවේ ඉතිහාස විෂය විර්ධනය පිළිබඳව විමර්ශන යක් කිරීමට වෙන්කර ගතිමි. ඒ යටතේ වැඩි අවධානයක් යොමු කළේ ඉතිහාස විෂය විෂයමාලාවට ඇතුල්වූ අවධියේ සිට වර්තමානය දක්වා සිදුවූදේ ඓතිහාසිකව (Choronologically ) විමසා බැලීමටය.

එනම්:-

1. ලංකාවේ විෂය මාලාවට ඉතිහාස විෂය ඇතුල්වීමේ සිට 1940 පමණ දක්වා විෂය වර්ධනය.

11 1945 නිදහස් අධ්‍යාපනය ආරම්භ කිරීමෙන් පසු කාලය තුළ කලා අධ්‍යාපනය පුළුල්වීම නිසා ඉතිහාස විෂයට හිමිවූ තැන පිරික්සීම.

111 1956 න් පසු විද්‍යා අධ්‍යාපනයට නැඹුරු වන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම නිසා ඉතිහාසය වැනි කලා විෂයන්ට හිමිවූ තැන.

1V 1970 දශකයේදී සමාජ අධ්‍යයන විෂය ද්විතීයික පාසලේ විෂය මාලාවට එක්වූ තැන් සිට 1990 දක්වා ඉතිහාස විෂය පිළිබඳ පැවති තත්වයද අවස්ථාවෙන් අවස්ථාවට සහේතුකවද ඉදිරිපත් කර ඇත.

අනතුරුව එන තුන්වැනි පරිච්ඡේදයෙහි ඉතිහාස විෂය පහත වැටීමට බලපෑ මානව්‍ය හා භෞතිය සාධක ඓතිහාසික අන්වීක්ෂණයකින් විස්තරාත්මකව විමසුවෙමි. එහිදී සවිඥානිකව හෝ අවිඥානිකව සිදු කෙරුණු වෙනස්කම් තුළින් ඉතිහාස විෂය කොතෙක් දුරට ගිලිහියාමක් සිදුවූයේද යන්න අදාල සෑම ක්ෂේත්‍රයක් ඔස්සේම එනම්:-

1. සමාජ අධ්‍යයනය උගන්වන ගුරුවරුන් තුළ පවතින ඉතිහාස විෂය දැනුම සෙවීම.

11 එම ගුරු උපදේශක වරුන් තුළ පවතින ඉතිහාස විෂය දැනුම සෙවීම

111 ඉතිහාස විෂය උගන්වන ගුරුවරුන්ගේ හා එම විෂය හදාරන්නේ නැති සිසුන්ගේ අදහස් (ප්‍රශ්නාවලියක් මගින්) විමසීම.

1V අ.පො.ස (සා.පෙ) පන්තිවල ඉතිහාස විෂය ඉගෙනුම කරන්නේ පාසල්වල සිටින දක්ෂතා අඩු ශිෂ්‍යයන්ය , පිළිබඳ සමීක්ෂණය කිරීම

V විශ්වවිද්‍යාලවල ඉතිහාස විෂය හදාරන පිරිස අඩුවීම පිළිබඳ

වශයෙන් සමීක්ෂණය කිරීමටද අමතක නොකළෙමි.

අවසන්හි එන හතරවන පරිච්ඡේදයෙන් ඉතිහාස විෂය පහත වැටීම වැලැක්වීමට යෙදිය හැකි පිළියම් හා යෝජනා ඉදිරිපත් කළෙමි. එහිදී ප්‍රතිපත්තිමය ක්ෂේත්‍රයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවායේ ස්වභාවය 1989 වසර දක්වාම විස්තර කළෙමි.

එයින් පසුව එම තත්වයට විසඳුම් ලෙස පාසල් මට්ටමෙන් අනුගමනය කළයුතු ක්ෂේත්‍රචාරිකා (සංස්කෘතික ත්‍රිකෝණ වැඩමුළු මගින් සොයාගෙන ඇති දෑ නැරඹීමට) කෞතුකාගාර වැඩමුළු වැනි ගුණාත්මක වටිනාකමක් මතුවන අවස්ථාද විමර්ෂණය කළෙමි.

ඉනික්බිතිව ද්විතීයික පාසලේ ඉතිහාස විෂය නැවත නගා සිටුවීමේ අරමුණෙන් ඉතිහාසය ඉගැන්වීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳවද අවධානය යොමු කළෙමි.

අවසාන වශයෙන් ඉතිහාස විෂය ජනප්‍රිය කරවීමේදී වර්තමානයට හා අනාගතයට යෝග්‍ය නව යෝජනා ඉදිරිපත් කිරීමේදී

1. සමාජඅධ්‍යයන ප්‍රමුඛ ගුරුවරුන් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරඇති යෝජනා

11 ඉතිහාසය වෙනම විෂයක් ලෙස ඉගැන්වීමට රාජ්‍ය අංශය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග

111 ගුරු පුහුණුව හා ඊට අදාල වෙනත් යෝජිත වැඩ පිළිවෙලවල් වැනි දෑ ඉදිරිපත් කර ඒවා ක්‍රියාවට නැංවීමේදී අවධානය යොමු කළයුතු අංශ පිළිබඳවද අවධානය යොමු කළෙමි.